ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

**<u>ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය අමර් චිත්‍ර කතා සිංහල ජාතක කතා පොත් බෙදා දෙයි</u>**

කොළඹ, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය මැදින් පොහෝ දිනය නිමිත්තෙන් 2025 මාර්තු 9 වන දින පැවති විශේෂ උත්සවයක දී අමර් චිත්‍ර කතා ජාතක කතා පොත් 5ක සිංහල පිටපත් 500ක් කිරිබත්ගොඩ ශ්‍රී සුදර්ශනාරාම පුරාණ විහාරයේ සිරි පඤ්ඤාතිස්ස ධර්ම විද්‍යාලයේ සිසු දරු දැරියන් වෙත බෙදා දුන්නේය.

2. ඉන්දියාවේ විශාලතම චිත්‍ර කතා ප්‍රකාශන ආයතනය වන අමර් චිත්‍ර කතා විසින් සිංහලට පරිවර්තනය කර ප්‍රකාශයට පත් කරන ලද මෙම පොත් ආකර්ෂණීය මාධ්‍යක් වන චිත්‍ර කතා හරහා ජාතක කතාවන්ගේ දැනුම සහ ප්‍රඥාව දරුවන් වෙත තිළිණ කරයි. බුදුන් වහන්සේගේ ඉගැන්වීම් විස්තරාත්මක කතා ඇසුරින් කුඩා දරුවන් වෙත ගෙන එන මෙම ජාතක කතා පොත් දරුවන් තුළ යහ ගුණ දම් වර්ධනය කරවීමට ඉවහල් වේ.

3. ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සංස්කෘතික අංශය වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මහාචාර්ය අංකුරන් දත්තා මහතා විසින් සංකේතාත්මකව පොත් කිහිපයක් දරුවන් වෙත බෙදා දෙන ලදී. මෙම මුලපිරීමට දරුවන්ගෙන් ඉහළ ප්‍රතිචාරයක් හිමි වූ අතර ඔවුහු ඔවුන්ගේ දහම් දැනුම සහ බෞද්ධ සාහිත්‍යය පිළිබඳ අවබෝධය පෝෂණය කිරීමට ඉවහල් වන මෙම පොත් බෙදා දීම බෙහෙවින් අගය කළහ.

4. මෙම මුලපිරීම බෞද්ධ උරුමය සහ සාහිත්‍යය පිළිබඳ අවබෝධය ඉහළ නංවමින් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ශිෂ්ටාචාරමය බැඳීම තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා වන පියවරකි. කුඩා දරුවන් නිර්මාණාත්මක ප්‍රවේශයකින් බුදුන් වහන්සේගේ ඉගැන්වීම් වෙත සමීප කරවීමේ අරමුණින් ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය දිවයින පුරා දහම් පාසල් වෙත මෙම ජාතක කතා පොත් බෙදා දීමට සැලසුම් කර ඇත.

***

**කොළඹ**
***2025** මාර්තු **12***